# න්‍යශ්ටික පවුල තුළ ඇති දැඩි වන අපේ ළමා පරපුර



**තමන් උපන් මාතෘ භූමියත් දැනට වාසය කරන රටත් අතර මානසිකව නිතරෝම දෝලනය වෙමින්, රැකියාවේ ප්‍රශ්න වලින්, මහළුවියට එලැඹෙමින්, දුරක වෙසෙන දෙමව්පියන් පිලිබඳ ප්‍රශ්න වලින්, ක්‍රමයෙන් යෞවන වියට පිය නගන තම වැඩිමහළු දූ දරුවන් පිළිබඳ ප්‍රශ්න වලින් සහ බොහෝ විට ඒ සියල්ලටම අමතරව විශාල නිවාස ණය බරකින් හෙම්බත් වී විශාල පීඩනයකට හසුව ඉතාම අවිවේකී ලෙස කල දවස හරින අපට බොහෝ විට නිදහසේ දරුවන්ට ඇහුම්කන් දීමට ඒවා වේලාව සොයා ගැනීමට අපහසු තරම්ය. මෙවන් වාතාවරනයක් යටතේ ළමුන් බොහෝ විට හුදකලා වීම ඉතා පහසුවෙන් සිදුවන්නකි.**

දෙමව්පියන් සහ ඔවුන්ගේ දූ දරුවන් එක්ව එකට ගත කල ඒ සියළුම හැඳින්වීම සඳහා අප භාවිතා කරන්නේ "පවුල" නැමැති වදනයි.

මව හා පියාත් ඔවුනට දාව උපන් දූ දරුවන් කිහිප දෙනාත් පමනක් ගත් කල එම කුඩාම පවුල අප හඳුන්වන්නේ "න්‍යශ්ටික පවුල" නමිනි.

මීට දශක අයක් දහයකට පමණ ඉහතදී තරම් ලංකාවේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල වාසය කල පවුල තුල පරම්පරා දෙකක ඥාතීන් එකට සිටීම ඉතාම සුලභ විය. කිරි අම්මා, කිරි අත්තා, මහප්පා, ලොකු අම්මා, බාප්පා, පුංචි අම්මා, සහ නැන්දා, මාමා වැනි ලේ ඥාතීන් සමූහයක් එකට සිටි මෙම පවුල ඉංග්‍රීසි භාෂාවේ නම් [Extended Family] ලෙස හැඳින්වේ. සිංහල භාෂාවේදී මෙය අපට "විස්තිරණ පවුල" ලෙසද හඳුන්වා දිය හැකිය.

අප පොත පතෙන් කියවා ඇති පරිදි දරුවෙකුට අවුරුදු පහ සම්පූර්ණ වන තෙක් ඔවුන්ට වැඩිහිටියන්ගෙන් ලැබෙන ආදරය දරුවාට දැනෙන ආකාරයටම ලබා දීම තුලින් පසුකාලීනව මනා පෞර්ෂත්වයකින් යුත් වැඩිහිටියකු සමාජයට දායාද කිරීමට ලැබෙනුයේ මහත් පිටුවහලකි.

පරම්පරා දෙකක ලේ නෑයන් අතර ඉපිද, ඔවුන් සියළු දෙනාගේම ඉමහත් ආදරය මැද හැදී වැඩී කුඩා කාලය ගත කරන කුඩා දරුවා මහත් වාසනාවන්තයෙකි. ඒ මන්ද යත් මෙම කුඩා දරුවන්ට තම දෙමව්පියන්ගෙන් ලැබෙන සෙනෙහස, ආදරයට අමතරව එකම නිවසේ වෙසෙන සියළුම නෑදයන් කල කාරනය නිරායාසයෙන්ම ඉෂ්ඨ වීමට ඉඩ සැලසෙන බැවිනි.

මෙහිදීද තම කිරි අත්තා සහ සහ කිරි අම්මාගෙන් තම මුනුබුරු මිනිබිරියන්ට ලැබෙන ආදරය උනුසුම ආරක්ෂාව සහ රැකවරනය ඉතාම සුවිශේෂී වේ.

තමන්ගේ ජීවිත වල අවිවේකී කලබලකාරී සමය පසු කර බොහෝ යුතුකම් සහ වගකීම් වලින් නිදහස් වී දිවිමංසලෙහි අගිස්සට ලංවී විශ්‍රාමික සුවයෙන්, ඉසිඹුලන මෙම කාල සීමාවේදී ඔවුන් හා තම මුනුබුරු මිනිබිරියන් අතර ඇතිවන්නේ ඉතා දැඩි බැඳීමකි. පා පොඩි ඔසවන වියේදීම ඔවුන් පසුපස වැටෙන මේ කුඩා දරුවන්ගෙන් මහළු මව්පියන් ලබන්නේ මහත් වූ සතුටකි.

නිතරෝම ප්‍රශ්ණ අසමින් තම බුද්ධියේ නිම්වලලු පුළුල් කර බහතෝරන වියේ අපේ දරුපැටවුනුත් ඔවුන් අසන සෑම ප්‍රශ්ණයකටම නිදහස් නිරවුල් පිලිතුරු දෙමින් දරුවන්ගේ සමාගමය තුලින් තම කාන්සිය මකා ගන්නට උත්සහ කරන මහළු මව්පියන් අතරත් ඇතිවන්නේ බිඳිය නොහැකි තරම් වූ සවිමත් බැම්මකි.

මෙයට අමතරව ඔවුන්ගේ දිගු ජීවිත ගමන තුල සිදුවන රසවත් සිදුවීම්, නිතර නිතර සිහි කරමින් එම අත්දැකීම් අන් අය සමග රස කර පවසමින් සතුටු වීමට උවමනා තරම් කාල වේලාවක් ඔවුන්ට තිබෙන නිසා ඔවුන්ට ඇහුම්කන් දෙන්නන් සෙවීමට අප මහළු මව්පියන් බොහෝ කැමතිය. නමුත් ප්‍රශ්ණය මතු වන්නේ ඔවුන්ගේ විඩාපත් වැඩිහිටි දූ දරුවන්ට ඒ සඳහා වෙන්කල හැකි නිදහස් කාල වේලාවක් හෝ නිරවුල්, විවේකි මනසක් හෝ නොතිබීමය. එයට හේතුව රැකියාව ගේ දොර වැඩපල දරුවන්ගේ වැඩපල වැනි නොයෙකුත් හේතූන් නිසා ඔවුන් ඉතා අවිවේකී දිවිපෙවෙතක් ගෙවීමය.

මෙවන් අවස්ථාවලදී අප මහළු වැඩිහිටියන්ගේ ප්‍රධානතම ඇහුම්කන් දෙන්නන් බවට පත්වී ඔවුන්ගේ පාළුව කාන්සිය මැකීමට ඉදිරිපත් වන්නේ මෙම මුනුබුරු මිනිබිරියන්ය. මෙම දෙපාර්ශවයම ඔවුනොවුන්ගේ සමාගමය තුලින් ලබා ගන්නේ වචනවලට පෙරලිය නොහැකි තරම් වන සංතුෂ්ඨියකි.

මෙයට අමතරව මෙම මහළු මව්පියන්ගේ දෛනික කටයුතු වලදීද ඔවුන් පසුපස යන කුඩා මුනුබුරු මිනිබිරියන් නොයෙකුත් ප්‍රශ්න අසමින් ඔවුන්ගේ අවට සමාජය පිලිබඳ දැනුම පුළුල් කර ගනී. කුඹුරේ පිටියේ වැඩක යෙදෙන වැඩිහිටියෙකු සමග සිටින කුඩා දරුවකුට ඒ වටපිටාව තුලින් ඉගෙන ගැනීමට ඇති දෑ බොහෝය. මෙවන් දරුවකුට සමනලයෙකුගේ ජීවන චක්‍රය, ගෙම්බාගේ ජීවන චක්‍රය වැනි පසු කාලීනව පංති කාමරය තුල ඉගෙන ගැනීමට ඇති විෂය කරුණු ස්වයං පරීක්ෂණයට ඉඩ සැලසෙන්නේ නිරායාසයෙනි. තවත් උදාහරනයක් ලෙස සති පොලට, කඩ පිලට යන කුඩා දරුවකුට එහිදී දකින්නට ලැබෙන්නේ මුලින් දුටුවාට වඩා වෙනස්ම සමාජ ලක්ෂණ සමූහයකි. මෙලෙස පාසල් යන වයස සම්පූර්ණ වනවිට දරුවා, ඒ වන විට සමාජය තුල ගැටීම තුලින් උකහාගෙන ඇති දැනුම් සම්භාරය අති මහත්ය.

මේ සියල්ලටම අමතරව කිරි අම්මා, කිරි අත්තා දන්නා ගමකථා, රස කථා සුරංගනා කථා වැනි නොයෙකුත් කතන්දර වලට ඔවුන්ගේ උකුල් තලයේ උනුසුමේ සිට ඇහුම්කන් දෙන මේ කුඩා දරු පැටවුන්ගේ පොත පත කියවීමේ රුචිකත්වය ඉතා ඉතිහාසය දැනගැනීමේ ආසාව දියුණු කියවීම තුලින් සාර්ථක මිනිසෙකු බිහිවීමට මංපෙත් හෙලි පෙහෙලි වන්නේ කාටත් හොරෙනි. මේ තුලින් පසු කාලීනව සාහිත්‍යයට, කවියට, කලාව ඇළුම් කරන සංවේදී වැඩිහිටියෙකු සමාජයට තිලින කිරීමට එම වැඩිහිටියන්ට හැකිවනු ඇත.

නමුත් පසුකාලීනව රැකීරක්ෂාවල යෙදීමේදී ඇතිවන ගැටළු වලට පිලියමක් ලෙසද තම දූ දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා වැනි නොයෙකුත් හේතූන් අරබයා නගරය වෙත ඒකරාශී වී මෙම "විස්තීර්ණ පවුල්" වලින් මිදී "න්‍යශ්ටික පවුල්" ලෙස ජීවත් වන මව පියා සහ ඔවුන්ගේ දූ දරුවන් පමනක් අයත් වන පවුල් සංඛ්‍යාව වැඩිවන්නට විය.

මෙලෙස නගර වෙත ඒකරාශී වූ පවුල්වල මව පියා දෙදෙනා බොහෝ විට රැකියාවල නිරතවන්නනන්ය. මෙහිදී ඔවුන්ගේ ළමා ලපටි රැකගැනීම "ආයම්මා" කෙනෙකුට හෝ මෑතකදී නම් "දිවා සුරැකුම් මධ්‍යස්ථානයකට" භාර වේ. මේ අවස්ථා දෙකෙහිදීම දරුවාගේ මානසික වර්ධනය, සතුට සහ ආරක්ෂාව වැනි බොහෝ පැති වලින් බැලූ විට සැලසෙන්නේ සෑහිමකට පත්විය නොහැකි තරම් වූ සුළු සේවයකි.

මධ්‍යකාලීනව ඔස්ට්‍රේලියාවට සංක්‍රමනය වූ සංක්‍රමනිකයන් වූ අපේ පවුල් සංස්ථාව තුල අපට දාව ඉපැදුන දූ දරුවන්ගේ පැත්තෙන් බැලූ කල මෙම තත්වය වඩාත් ඛේදජනක වේ.

තමන් උපන් මාතෘ භූමියත් දැනට වාසය කරන රටත් අතර මානසිකව නිතරෝම දෝලනය වෙමින්, රැකියාවේ ප්‍රශ්න වලින්, මහළුවියට එලැඹෙමින්, දුරක වෙසෙන දෙමව්පියන් පිලිබඳ ප්‍රශ්න වලින්, ක්‍රමයෙන් යෞවන වියට පිය නගන තම වැඩිමහළු දූ දරුවන් පිළිබඳ ප්‍රශ්න වලින් සහ බොහෝ විට ඒ සියල්ලටම අමතරව විශාල නිවාස ණය බරකින් හෙම්බත් වී විශාල පීඩනයකට හසුව ඉතාම අවිවේකී ලෙස කල දවස හරින අපට බොහෝ විට නිදහසේ දරුවන්ට ඇහුම්කන් දීමට ඒවා වේලාව සොයා ගැනීමට අපහසු තරම්ය. මෙවන් වාතාවරනයක් යටතේ ළමුන් බොහෝ විට හුදකලා වීම ඉතා පහසුවෙන් සිදුවන්නකි.

ලංකාවේදී නම් අපි අපේ වැඩපල කරගන්නා තෙක් අපේ ළමා ළපටින් රැකබලා ගැනීමේ කාර්යය අපේ මව් පියන් ළඟපාතක සිටී නම් ඔවුන් සියතට ගන්නේ මහත් සතුටිනි. නමුත් මා අත් දැක ඇති පරිදි මෙහිදී අප සහයට ඉදිරිපත් වන්නේ රූපවාහිනයයි. නොයෙකුත් කාටූන් වැඩසටහන්, විගල්ස්, ඎ1 -5 වැනි ළමා වැඩසටහන් නැරඹීමට දරුවාට ඉඩ හැර අපි අපේ ගෙදර දොර වැඩපල කරගැනීමට දරුවා රවට්ටා කෑම ටික කවා ගැනීමට උත්සුක වන්නේ ඉන් දරුවාට සිදුවන අයහපත ගැන සිතීම පසුවට කල් දමමිනි. නමුත් ප්‍රාථමික අධ්‍යාපනය අරඹන දරුවා රූපවාහිනියෙන් මුදවා පොත පතට යොමු කිරීම අපහසු කාර්යයක් බව වැටහී ඒ පිලිබඳව මැසිවිලි නැගීමට පටන් ගන්නා විටත් දරුවා රූපවාහිනයට ඇබ්බැහි වී හමාරය.

ඔස්ට්‍රේලියාවේ ඉපැදුන අපේ දරු දැරියන් තුල තමන් අවට ලෝකය පිලිබඳ දැනුම ඉතා අල්පය. පොත පතේ වැඩ ඉතා හොඳින් කරන දරුවන් තුල පවා මෙම දුර්වලතාවය දක්නට ලැබේ. එයට හේතුව ලෙස මා නම් දකින්නේ ඔවුන් සමාජය සමග ගැටී ලබා ගන්නා දැනුම ඉතාම අල්ප වීමය. රැකියාවන්හි නිරතවීම හේතුවෙන් අපිට තිබෙන අවිවේකි බව නිසාත් අපට නහුරු දේශගුනික තත්වයන් නිසාත් උදාහරනයක් ලෙස ශීත කාලයේදී දරුවන් සමඟ වැඩිපුර එලිමහනේ ගැවසීමට මැලිවීම මෙන්ම බටහිර සංස්කෘතියේ ඇති නොයෙකුත් අපචාර වලට ළමයා ගොදුරු වෙතැයි ඇති කරගන්නා බිය නිසාත් මෙම සමාජයට දරුවන් මුදා හැරීමට පෙර අපි දෙවරක් සිතා බැලීමට පුරුදුව සිටින්නෝ වෙමු.

ඉහත කී කාරණා නිසාම දරුවන් පාසලට රැගෙන යාම සහ ඒම වැනි සියළුම දේ පෞද්ගලික වාහන වලින්ම සිදු කිරීමට බොහෝවිට අපි පෙළඹී සිටිමු. මේ හේතූන් නිසාම දරුවාට අවට සමාජය සමග ගැටීමට ඇති ඉඩ කඩ ඉතාම අල්පය. ඒ නිසාම අප දරුවාට නිවසින් සහ පාසලින් ඔබ්බට ඇති සුවිසල් සමාජය පිළිබඳ දැනුමක් ඇත්තේම නැති තරම්ය.

මෙවන් වාතාවරනයක් යටතේ "න්‍යශ්ටික පවුල" තුල ඇති දැඩි වන අපේ ළමා පරපුර ඉතා අල්ප දැනුම් සම්භාරයක් සමග වයසින් වැඩෙමින් වැඩිහිටියන් වී සමාජයට ගිය කල ඔවුනට මුහුණ පෑමට සිදුවන නොයෙක් ආකාරයේ ප්‍රශ්න වලට පිලිතුරු සපයා ගනිමින්, නොසැලී සිටීමට තරම් දරා ගැනීමේ හැකියාවක් ඔවුනට තිබේදැයි යන්න සැක සහිතය.

සුභාෂිණී හේරත් - ඇට්වුඩ්

TAX - TAX - TAX

Do you want the maximum Tax Refund Quickly?
We prepare tax returns
with the lowest possible tax legally payable.

- Preparation & Lodgement of Tax Returns
- Preparation & Lodgement of Business Activity Statements
- GST Registration
- Income Activity Statements
- Lodgement of ABN & TFN applications
- Business name registration
- Bookkeeping

Dave Susith Balapitiya
MBA, BSc, MNIA, MAAT, ASA
WIZARD ACCOUNTING
Registered Tax agent & Professional Accountant

Office hours
Friday 8.30am to 10.00pm
Monday to Thursday 6.30pm & 10.00 pm
Saturday & Sunday 8.30am to 5.00 pm

31 Eildon Drive Keysborough 3173
(Mel Ref 89 B8)

Tel 03 9711 5743 Mobile 0433 58 49 68
Email: wizaccounting@optusnet.com.au